

# මගේ ලෝකය

ඇසෙන දැනෙන දේ..
හිතට වැදෙන දේ..

ජගත් ජේ එදිරිසිංහ

# සිරිසුමන ගණේවත්ත, ඉන්ද්‍රා පුෂ්පානි සහ මගේ ලෝකය

කාලය බොහෝ දුර අප ගෙන ගොස් ඇති බව පසක් වන්නේ ඉඳ හිට ය. ඒ අතර පාසල් සිසුවකුව ගෙවූ ගැටවර වියේ මතක සටහන්ද වරින් වර සිත මතුපිටට පැමිණෙන්නේ එක්තරා සතුටක් ද සිතේ ඇති කරවමින් ය.

වසර විසි පහකටත් එහා කාලයක අප නව වන හෝ දහවන ශ්‍රේණියේ ඉගෙනුම ලබමින් සිටි මේ කියන යුගයේ දී මම මොනිටර් එක්සයිස් පොත්වල ලියූ නවකතා තුන හතරක ද කවි සහ කෙටිකතා ගොන්නක ද නිර්මාණකරුවා වී සිටියෙමි. මගේ මේ ලිවීම සිදුවන්නේ අපේ දෙමාපියන්ද නොදැනුවත්ව බැවින් මේ එකදු නිර්මාණයක් හෝ කිසිම තරගයකට යවන්නට හෝ පොත් වශයෙන් මුද්‍රණය කරවාගන්නට හෝ හැකියාවක් හෝ දැනුමක් හෝ අපට නොවී ය. මේ අරමුණු දෙක සඳහාම මා පෙළඹවූ පාසල් සිසුවකු හා සිසුවියක පිළිබඳ මතකය මගේ සිතේ තැන්පත්ව ඇත. මා කිසි දිනෙක දැක නැති දැන හඳුනාගෙන නොසිටි මේ දෙදෙනා ඒ වන විට නිර්මාණකරුවකු ලෙස ගොඩනැගෙමින් සිටි මා කෙරෙහි ඇති කළ බලපෑම අද පවා මට වටහා ගත නොහැකි තරම් විශාල ය.

සිසුවිය මාතර බාලිකා විද්‍යාලයක උසස් පෙළ හදාරමින් සිටියා ය. නමින් ඉන්ද්‍රා පුෂ්පානි ජයවර්ධන වූ ඇය "අණ බෙර ගසා කියන වගයි" නමින් නිර්මාණ සංග්‍රහයක් එළිදැක්වූයේ ප්‍රදීප ප්‍රකාශකයන් ගේ අනුග්‍රහය ඇතිව ය. මගේ නිර්මාණ එකතුවක්ද එළි දැක්විය යුතු යයි පළමු උත්තේජනය ඇති කළේ ඇය යි. (මේ කතාව මා කලින් වතාවක් ද ලියා ඇති බව මතකය) ප්‍රදීප ප්‍රකාශකයෝ ආයතනයේ අයිතිකරු ප්‍රවීණ ගත්කතුවර කේ ජයතිලක බව මම නොදැන සිටියෙමි. ඉන්ද්‍රා පුෂ්පානිට අනුග්‍රහය දැක් වූ ප්‍රදීප ප්‍රකාශකයන් මටද අනුග්‍රහය දක්වනු ඇතැයි මට සිතුණි. මගේ නිර්මාණ එකතුවක් එළි දැක්වීම සඳහා අනුග්‍රහය දක්වන්නැයි ඉල්ලා මම ප්‍රදීප ප්‍රකාශකයන්ට ලිපියක් යැව්වෙමි. "අපි ආධුනික ලේඛකයන්ගේ නිර්මාණ ප්‍රකාශය සඳහා බාර නොගනිමු" යයි හැරෙන තැපෑලෙන් පිළිතුරු ලදිමි. පාසල් සිසුවකුව සිටියදී නිර්මාණ සංග්‍රහයක් එළි දැක්වීමේ මගේ අදහස එතැනින්ම අවසන් විය.




මගේ මේ ලිපියට වැදගත් වන අනෙක් සිසුවා ද දකුණේ ය. ගාල්ලේ මහා විද්‍යාලයක (රිච්මන්ඩ්?) ඉගෙනුම ලබමින් සිටි ඔහු සිරිසුමන ගණේවත්ත නම් විය. සිරිසුමන ගණේවත්ත ශිෂ්‍යයා සමස්ත ලංකා රචනා තරගයකින් පිට පිට වසර දෙකක්ම ප්‍රථම ස්ථානය දිනා ගත්තේ ය. ඒ වන විටත් දක්ෂ රචනා ලියන්නෙකු ලෙස පාසලේ නම රන්දාගෙන සිටි මට ද සිරිසුමන ගණේවත්ත ශිෂ්‍යයා මෙන් සමස්ත ලංකා රචනා තරගයකට මගේ රචනා යැවීමේ අති මහත් ආශාවක් ඇති විය. එහෙත් ඒ සඳහා කුමක් කළ යුතුද කියාවත් මම නොදැන සිටියෙමි. කලක් ගත වන විට ඒ ආසාව මගේ සිතෙන් තුරන්ව ගියේ මා දිගින් දිගටම පුවත් පත් වලට ලිපි සපයන්නට උනන්දු වු නිසා විය යුතු ය. එයින් පසු කිසි දිනෙක සිරිසුමන ගණේවත්ත ශිෂ්‍යයා පිළිබඳ තොරතුරක් මට දැනගන්නට නොලැබුණි.

මේ කතාවේ දෙවන කොටස ඇරඹෙන්නේ එයින් වසර විසිපහකට විසි හයකට පමණ පසුව ය.

මම වසර 2000 දී මගේ පළමු නිර්මාණ සංග්‍රහය එළි දැක්වූයෙමි. ඒ "කන්ද උඩ මාලිගාව" කෙටි කතා සංග්‍රහයයි. මේ වන විට නිකුත් වී තිබූ නන්දා මාලිනියගේ "අරලිය ලන්දට" ගී එකතුවට ඉන්ද්‍රා පුෂ්පානි ගේ ගීයක්ද ඇතුළත් විය. කැසට් පටය සමගින් නිකුත් වූ පොත් පිංචේ ඇගේ ලිපිනයද තිබුණි. "වසර විසිගණනකට පෙර ඔබ මා සිතේ ඇති කළ උත්තේජනයෙන් බිහි වූ මේ නිර්මාණ සංග්‍රහය පිළිගන්න" යි කුඩා සටහනක් ද සහිතව මම මගේ පොත ඇයට තැපැල් කළෙමි. සිය සතුට හා විස්මය දන්වමින් ඇය පිළිතුරු ලිපියක් එව්වා ය.

"කන්ද උඩ මාලිගාව" සම්බන්ධව එවකට මෙල්බන් 3zzz ගුවන් විදුලියට සම්බන්ධව සිටි විද්වතකු වන උපා උපදාස මහතා ඉතා විශිෂ්ට හරවත් සාකච්ඡාවක් කළේ ය. මේ පොත පිළිබඳව කතා බහ සිදුවෙමින් පවතින අතරේ දී මට සිඩ්නි නුවර පදිංචි ආචාර්ය පාලිත ගණේවත්ත ගෙන් දුරකතන ඇමතුමක් ලැබුණි. සාහිත්‍ය නිර්මාණ පිළිබඳ බොහෝ දේ අපේ කතා බහට මාතෘකා වූයේ එය අප දෙදෙනාටම පොදු විෂයයක් වූ බැවින් ය. පාලිත අධ්‍යාපනය ලැබුවේ ද ගාල්ලේ බව ඒ අතරේදී මම දැන ගතිමි. පාලිතගේ වාසගම ගණේවත්ත බැවින් එකත් එකටම සිරිසුමන ගණේවත්ත පිළිබඳ යමක් පාලිත දැන සිටිනු ඇතැයි මම අනුමාන කළෙමි.

"සිරිසුමන ගණේවත්ත අඳුනනවද?" මම ඇසුවෙමි. පාලිත සිනාසුණේ ය.

"සිරිසුමන ගණේවත්ත කියන්නෙ මමම තමයි. මගේ නම සිරිසුමන පාලිත ගණේවත්ත .. ඔස්ට්‍රේලියාවෙදි ලේසියට පාලිත නම පාවිච්චි කරන්න ගත්තා.." ඔහු කීවේ ය.

අප ජීවත් වන්නේ කොයි තරම් කුඩා ලෝකයක ද?

අවුරුදු විසි ගණනකට පෙර මා අසා තිබූ මගේ සිතේ රැඳී තිබූ සිරිසුමන ගණේවත්ත මගේ හිතවතකු වීමේ සතුට අදත් මම භුක්ති විඳිමි. ඔහු නිර්මාණකරුවකු ලෙස ඉදිරියට යනු බලා මම මහත් සේ සතුටට පත් වුණෙමි. පහන පුවත්පතේදීත් සන්නස පුවත්පතේදීත් අපි එක්ව වැඩ කළෙමු. ඔහු සමග කටයුතු කිරීම පහසුය. ඔහුගේ තැන්පත් බව නිරහංකාර බව එයට හේතුව යයි මම සිතමි.

ඔහු අතින් බිහිවුණ "ඇසි පිය" කාව්‍ය සංග්‍රහය මගේ සිතේ මහත් සතුටක් ඇති කළේ ය. අපේ හිතවත් ශ්‍රීනාත් මද්දුමගේ සමගින් "ඇසි පිය" පොතේ කවි එකින් එක ගෙන සාකච්ඡා කරමින් රස වින්ද ආකාරය කිසි දිනෙක අපේ මතකයෙන් ඈත් නොවේ.

පාලිත ඉන්පසු නිකුත් කළ "ඇවිත් නොරටක" නවකතාව බොහෝ හේතු කාරණා නිසාවෙන් මගේ සිතේ සතුටක් ඇති කළේ නැත. මම ඔහුට ඒ බව කීවෙමි. මගේ අදහස් දැක්වීම පාලිතගේ සතුටට හේතු නොවූ බවද මම දනිමි. එසේ වුව ද ඔහු එය දරා සිටියේ නිර්මාණකරුවකු ලෙස විවේචන දරා සිටීමේ හැකියාව තමන්ට ඇති බව පෙන්වා දෙමින් ය.



පාලිත ගේ දෙවන නවකතාව දැන් මගේ අතේ ඇත. දයාවංශ ජයකොඩි සමාගම විසින් වසරක් පාසා පවත්වනු ලබන නවකතා අත්පිටපත් තරගයෙන් ජයගත් පාලිත ගේ "මාවත අබියස" නවකතාවට පාදක වී ඇත්තේ හැටේ හැත්තෑව දශක වල ගාල්ලේ ජීවත් වූ මධ්‍යම පාන්තික පවුලක කතාවයි.

නවකතාවේ පාලිතගේ බස නිරවුල් ය. මේ කාලයේ ලියැවෙන බොහෝ නවකතාවල දක්නට ලැබෙන වියරණ දොස් පාලිතගේ නවකතාවේ දකින්නට නැති තරම් ය. වියරණ නොසළකා දුර්වල බසින් මහා පරිමානයෙන් නවකතා ලියවෙන මේ යුගයේ විගාමික ලේඛකයකු අතින් පොහොසත් බසකින් යමක් ලියවෙනු දැකීම පවා සතුටකි. අපේ ප්‍රවීණ ගත් කතුවර ඩී බී කුරුප්පු ශූරීන්ගේ එක් පැතුමක් - නිවැරදි බසින් ලියන විගාමික ලේඛකයන් දැකීමේ පැතුම - ඉටු කරන්නට අවම වශයෙන් පාලිත හෝ සමත් වී ඇතැයි මට සිතෙයි.

"මාවත අබියස" නවකතාව පිළිබඳ විචාරයක් හෝ විවරණයක් ලියන්නට මම අදහස් නොකරමි. ඒ කටයුත්ත රසික සූරියආරච්චි සොහොයුරා වඩා හොඳින් සිදුකරනු ඇත

පාලිත ගණේවත්ත බොහෝ ඇසූ පිරූ තැන් ඇති බුද්ධිමත් නිර්මාණකරුවෙකි. පුළුල් දැක්මක් සහ සංයමයකින් යුතු නිර්මාණකරුවෙකි. බොහෝ පොත පත කියවා සාහිත්‍යයේ සීමා මායිම් හඳුනාගෙන ඇති නිර්මාණකරුවෙකි. එසේ වන




පාලිත ගණේවත්ත බොහෝ දුර යන බොහෝ දුර යායුතු නිර්මාණකරුවකු බව සඳහන් කරමින් මගේ මේ මතක සටහන නිමා කරන්නට කැමැත්තෙමි.

■

සන්නස
වෙළඳ දැන්වීම් සඳහා විමසන්න
03 8707 4604
හෝ 0402 025 516
email- ads.sannasa@gmail.com